# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/01/I/පොදු | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2022.11 10 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>උපත්,විවාහ,මරණ ලේඛනයන්හි සහතික පිටපත්වල වලංගු කාලය තීරණය කිරීම.</u>**

උක්ත මැයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කර ඇති අංක RG/e-mbd/පොදු හා 2022.10.10 දිනැති ලිපියෙහි පිටපතක්මේ සමඟ ඔබ වෙත එවමි.

02. උපත්, විවාහ, මරණ ලේඛනයන්හි සහතික පිටපත් නිකුත් කිරීම රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්යභාරයක් වන බවත්, 1951 අංක 17 දරණ උප්පැන්න මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 57 වගන්තිය, 1907 අංක 19 දරණ විවාහ ලියාපදිංචි කිරීමේ (සාමාන්‍ය) ආඥා පනතේ 52 වගන්තිය, 1952 අංක 44 දරණ උඩරට විවාහ සහ දික්කසාද පනතේ 56 වගන්තිය, 1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ 70,71 වගන්තීන්හි දැක්වෙන ආකාරයටද රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන සහතික පිටපත බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂ්‍යයක් ලෙස දක්වා ඇති බවත් එහි සඳහන් කර ඇත.

03. ඒ අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන උප්පැන්න, විවාහ හා මරණ ලේඛනයක් ඕනෑම කාලසීමාවක් සඳහා වලංගු වන බවත් මේ බව ඔබට අයත් ආයතනවල ආයතන ප්‍රධානීන් ද දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත්, කාරුණිකව දන්වා සිටිමි.

සුමිත් අලහකෝන්,
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

පිටපත :- රෙජිස්ට්‍රාර් ජනරාල්,රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - කරු. දැ.ගැ.ස


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } 091 4944002 කාර්යාලය / காரியாலயம் / Office } 091 4119011 091 2226118 ෆැක්ස් / பெக்ஸ் / Fax } 091 2246299 විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail } chiefsec1@sltnet.lk වෙබ් අඩවිය / இ தளம் / Web site } www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

CamScanner

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. RG/e-mbd/පොදු

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022.10. 1?

සුමිත් අලහකෝන් මහතා,
ප්‍රධාන ලේකම් (දකුණු පළාත),
ප්‍රධාන ලේකම් කාර්යාලය,
ගාල්ල.

25 OCT 2022
DCS/A

**උපත්, විවාහ, මරණ ලේඛනයන්හි සහතික පිටපත්වල වලංගු කාලය තීරණය කිරීම.**

උපත්, විවාහ, මරණ ලේඛනයන්හි සහතික පිටපත් නිකුත් කිරීම රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්යභාරයක් වන අතර 1951 අංක 17 දරණ උප්පැන්න මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 57 වගන්තිය, 1907 අංක 19 දරණ විවාහ ලියාපදිංචි කිරීමේ (සාමාන්‍ය) ආඥා පනතේ 52 වගන්තිය, 1952 අංක 44 දරණ උඩරට විවාහ සහ දික්කසාද පනතේ 56 වගන්තිය, 1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ 70,71 වගන්තීන්හි දැක්වෙන ආකාරයටද රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන සහතික පිටපත බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂ්‍යයක් ලෙස දක්වා ඇත.

02. ඒ අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන සහතික පිටපතක වලංගු කාලය කිසිදු සීමාවකට ලක් නොකර පිළිගන්නා ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ආගමන විගමන දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු මේ වන විටත් සිදු කර ඇත.

03. මේ පිළිබඳව මාධ්‍ය මඟින්ද මහජනයා දැනුවත් කිරීමක් සිදු කළද සහතික පිටපත් ඉල්ලුම් කිරීමෙහි අඩුවීමක් දක්නට නොමැති බව නිරීක්ෂණය විය. එබැවින් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන උප්පැන්න, විවාහ හා මරණ ලේඛනයක් ඔනෑම කාල සීමාවක් සඳහා වලංගු බව ඔබ පළාතට අයත් කලාප කාර්යාල ප්‍රධානීන් ඇතුළු සියලුම අධ්‍යාපන බලධාරීන් හා සෙසු ආයතනය දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

පී.එස්.පී.අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්

දු.ක. - 011-2889540
ෆැක්ස් - 011-2889498
විද්‍යුත් ලිපිනය - mbd@rgd.gov.lk

01. පිටපත:- ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස

CamScanner